

කාර්යසාධන වාර්තාව

2024

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

නව මහ ලේකම් කාර්යාලය, මාළිගාවත්ත,

කොළඹ -10

දුරකථන : 011-2446183 – 4 / ෆැක්ස් : 011-2541184

වෙබ් : www.fisheries.gov.lk

විද්‍යුත් ලිපිනය : secfisherieslk@gmail.com

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආයතනයේ නම - ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය - 151

අන්තර්ගතය **පිටු අංකය**

පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ	03
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	10
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	12
පරිච්ඡේදය 04	-	කාර්යසාධන දර්ශක	20
පරිච්ඡේදය 05	-	තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්යසාධනය	20
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ	23
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව	25

01 - ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් පදනම වර්ග කිලෝමීටර් 517,000 ක අනන්‍ය ආර්ථික කලාපයකින්ද, වර්ග කිලෝ මීටර් 21,500 ක දේශීය ජල තීරයකින්ද, වර්ග කිලෝ මීටර් 1,580 ක කලපු හා ගං මෝයවල් වලින්ද, වර්ග කිලෝ මීටර් 2,600 ක මිනිසා විසින් සාදන ලද ජලාශ වලින්ද සමන්විත වේ. බොකු, කලපු, ජලාශ සහ වෙරළබඩ මෙන් ම ජලාශ ආශ්‍රිතව පිහිටා ඇති ඉඩම් ද ජලජීවිවගා සංවර්ධනය සඳහා අවශ්‍ය සම්පත් පදනම නිර්මාණය කරයි.

ධීවර අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන වලට අනුව මෙරට ධීවරයින් සංඛ්‍යාව 318,470 ක් වන අතර මින් 223,720 ක් කරදිය ධීවර අංශයේ රැකියාවේ නියුක්ත වී සිටින අතර ඉන් 85% ක් පමණ වෙරළාසන්න ධීවරයින් වන අතර 34,550 ක් බහු දින ධීවර යාත්‍රා වලින් අක්වෙරළ හා ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තයෙහි නිරතවේ. මෙරට ධීවර පවුල් සංඛ්‍යාව 273,240 ක් වන අතර ධීවර කර්මාන්තයෙන් සෘජුවම යැපෙන්නන් සංඛ්‍යාව 1,123,000 ක් පමණ වේ. ධීවර කර්මාන්තය හා ආශ්‍රිත වෙනත් යැපීම් සලසා ගන්නා පිරිස මිලියන 2.7 ක් පමණ වන බවට ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සමස්ථ ජනගහනයෙන් 18% ක් පමණ ධීවර කර්මාන්තය ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගනියි.

2024 වසරේදී කරදිය ධීවර කර්මාන්තයෙන් මෙ.ටො.308,430 ක මත්ස්‍ය නිෂ්පාදනයක් සපුරා ඇත. මෙ.ටො. 102,330 ක මත්ස්‍ය අස්වැන්නක් මිරිදිය ධීවර කර්මාන්තය මඟින් ලබාගැනීමට සමත් වී ඇත. ඒ අනුව 2024 වසර තුල සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. 410,760 කි.

මහජනතාවගේ සත්ත්ව ප්‍රෝටීන ප්‍රධාන ප්‍රභවය ලෙස මත්ස්‍ය පරිභෝජනය ප්‍රචලිතය. 2024 වර්ෂය තුලදී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 36.85 කි. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 7.4% ක වැඩිවීමකි. දැනට මෙරට පරිභෝජනයට අවශ්‍ය සමස්ථ මත්ස්‍ය ප්‍රමාණයෙන් 72% ක් පමණ දේශීය මත්ස්‍ය නිෂ්පාදනයෙන් සපයයි.

2024 වර්ෂය තුලදී මත්ස්‍ය අපනයනවල වටිනාකම රු.මි 86,241 කි. (ඇ.ඩො.මි. 285.2) ජාතික අපනයන ආදායමට ධීවර අංශයේ දායකත්වය 2.3% ක් පමණ වේ. අපනයන දත්තවලට අනුව, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදනවලින් 43.1% ක් යුරෝපය වෙත අපනයනය කරන අතර ඉන් 29.3% ක් යුරෝපා සංගමය වෙත ද, ඉතිරි 13.8% ක් යුරෝපා සංගමය නොවන රටවල් වෙත ද අපනයනය කරයි. මීට අමතරව, එම කාලපරිච්ඡේදය තුළදී විසිතුරු මත්ස්‍ය අපනයනය මඟින් රු.මි. 7,392 ක ආදායමක් ලබාගැනීමට හැකිවී ඇත.

2024 වර්ෂය සඳහා 151 වැය ශීර්ෂය යටතේ ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය සඳහා රු. මි. 7,273.408 ප්‍රාග්ධන ප්‍රතිපාදන හා රු.මි. 1,981.994 ක පුනරාවර්තන ප්‍රතිපාදන වෙන් කල අතර එහි මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් රු.මි.6,057.44 (84%) හා රු.මි. 1,828.20 (92.24%) කි. 2024 වර්ෂය සඳහා 290 වැය ශීර්ෂය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත රු. මි. 102.08ක ප්‍රාග්ධන ප්‍රතිපාදන හා රු.මි. 1,657.99 ක පුනරාවර්තන ප්‍රතිපාදන වෙන් කල අතර එහි මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් රු.මි.36.42 (36%) හා රු.මි. 875.38 (53%) කි.

ධීවර ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම හා මත්ස්‍ය පසු අස්වනු හානි අවම කිරීම මඟින් ගුණාත්මකභාවයෙන් ඉහළ මත්ස්‍ය නිෂ්පාදනයක් අරමුණු කරගනිමින් ධීවර වරායන් සංවර්ධනය කිරීම 2024 වසරේදී ක්‍රියාත්මක වූ ප්‍රමුඛ වැඩසටහනකි. මෙමඟින් ගන්දර ධීවර වරායේ ගොඩබිම ආශ්‍රිත ඉදිරි වැඩකටයුතු නිමකිරීම හා මයිලඩි ධීවර වරායේ දෙවන අදියරේ වැඩකටයුතු අවසන් කර ඇත. 2024 අයවැය යෝජනාව යටතේ උතුරු පලාත් ධීවර තොටුපලවල් හා නැංගුරම්පොල සංවර්ධනයට අවශ්‍ය

අනුමැතීන් ලබාගෙන අබණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතී. හික්කඩුව, අම්බලන්ගොඩ, වාලච්චේන හා දොඩංදුව ධීවර වරායන් සංවර්ධනය කිරීම සඳහා අදාල මූලික පාරිසරක වාර්තා මේ වනවිට සකස් කරමින් පවතී. කලපු හා අභ්‍යන්තර ජලාශ ආශ්‍රිත ජලජ පරිසර සංරක්ෂණය හා සංවර්ධනය තුලින් ජලජීවී නිෂ්පාදනය ඉහල නැංවීම ප්‍රධාන අරමුණ කරගනිමින් නන්දිකඩාල් කලපුව පිරිසිදු කිරීමේ කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයක් යටතේ සම්පූර්ණ කිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. නයාරු කලපුව පිරිසිදු කිරීම සඳහා නාරා ආයතනය විසින් මූලික පාරිසරික අධ්‍යනය සිදු කර අවසන්ය.

ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) සංකල්පමය වශයෙන් හඳුන්වා දෙන ලද "නීල/ හරිත වර්ධන" (Blue Growth) සංකල්පය මගින් දේශගුණික විපර්යාස වලට අනුවර්තනයක් ලෙස මෙන්ම ආහාර සුරක්ෂිතතාව සඳහා මත්ස්‍ය ගහන වැඩිදියුණු කිරීම සහතික කිරීම සඳහා වෙරළබඩ ප්‍රදේශවල මත්ස්‍ය ඒකරාශී කිරීමේ ඇටවුම් (FAD) ස්ථාපනය කිරීම මඟින් ආහාරයට ගත හැකි මසුන්ගේ ඒකරාශීවීම මෙම ඇටවුම් ආශ්‍රිතව සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. එසේම මෙම මත්ස්‍ය ඒකරාශි වීම හේතුවෙන් දැනටමත් ප්‍රදේශයේ ධීවර ප්‍රජාව මෙම වැඩසටහන ගැන සිය ප්‍රසාදය පළකර සිටිති. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ජාතික ජලජ සම්පත් සංවර්ධන හා පර්යේෂණ නියෝජිතායතනය මගින් මෙම වසරේදී කොග්ගල ප්‍රදේශයේ එක් ඇටවුමක් ස්ථාපනය කරන ලදී.

උතුරු හා නැගෙනහිර පළාත්වල අඩු ආදායම්ලාභී ධීවර පවුල් සඳහා රු.මි. 1,804.00 ක චීන සමූහාණ්ඩු ආධාර යටතේ සහල් මෙට්‍රික් ටොන් 1,630 ක්,පෙර සැකසූ නිවාස 500ක් සහ මත්ස්‍ය දැල් 75,000ක් ලබා දීම 2024 වර්ෂයේදී සිදුකරන ලදී.

නිරසාර සංස්කෘතිය පදනම් කරගත් මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ග්‍රාමීය ජීවනෝපාය වැඩිදියුණු කිරීම සඳහා ධීවර අමාත්‍යාංශය සමඟ එක්ව ජපාන රජය එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) හරහා ඇමරිකානු ඩොලර් මිලියන 3 ක ප්‍රදානයක් ලබා දී ඇති අතර කාලගුණ හා දේශගුණික විපර්යාසයන් මඟින් ධීවර ක්ෂේත්‍රය වෙත ඇතිකරන බලපෑම්වලට අවම කිරීම සඳහා FAO සංවිධානය හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) මඟින් ද ලබාදුන් ප්‍රධානයන් යටතේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී.

නිසි විද්‍යාත්මක ක්‍රමවේද හා ප්‍රායෝගික උපක්‍රම තුලින් තිරසර හා පරිසර හිතකාමී ලෙස සංවර්ධනය හා කළමනාකරණය කිරීමටත්, ඒ තුලින් මත්ස්‍ය නිෂ්පාදන සුලභ කිරීම හා පාරිභෝගිකයාට සාධාරණ මිලකට ලබාගත හැකි තත්ත්වයකට පත් කිරීමත්, කර්මාන්තයේ නියැලෙන්නන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමත් අරමුණු කොට නව රජයේ ‘පොහොසත් රටක් ලස්සන ජීවිතයක්’ ප්‍රතිපත්ති රාමුවේ තිරසර කළමනාකරණයක් - ගුණාත්මක මත්ස්‍ය සම්පතක් ප්‍රධාන ප්‍රතිපත්තියක් ලෙස දක්වා ඇති අතර ඒ අනුව වැඩසටහන්/ව්‍යාපෘති ධීවර කර්මාන්තය නංවාලීම සඳහා 2025 වසර තුල ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ධීවර හා ජලජ සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛයාවීම

මෙහෙවර

වර්තමාන හා අනාගත පරපුරේ යහපත උදෙසා ධීවර හා ජලජ සම්පත් භාවිතය කලමනාකරණය කිරීම.

ප්‍රතිපත්තිමය අරමුණු

- විද්‍යානුකූල පදනමකින් යුත් (science based) තොරතුරු භාවිතා කරමින් සම්පත් තිරසාර ලෙස කලමනාකරණය කිරීම.
- ධීවර කර්මාන්තය කලාපීය හා ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම.
- සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම
- ජලජීවීවගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
- පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.
- ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
- අපනයන ආදායම් ඉහළ නැංවීම.
- විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.
- ධීවර ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.


1.3. ප්‍රධාන කාර්යයන්

අංක 2412/08 හා 2024.11.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පවරා ඇති විෂයයන් හා කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ධීවර, ජලජ හා සාගර සම්පත් විෂයයන්ට සහ අදාලව අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
4. ජාතික ජලජ සම්පත් සංවර්ධන හා පර්යේෂණ නියෝජිතායතනයේ පර්යේෂණ සහ සංවර්වධන අවස්ථා පුළුල් කිරීම
5. ජාත්‍යන්තර සම්මුතීන්, ගිවිසුම් සහ ප්‍රමිතීන්ට අනුකූලව ධීවර කර්මාන්තයට බාධාවක් වන නීති රෙගුලාසි සහ ක්‍රියා පිළිවෙත් සංශෝධනය කිරීම
6. ධීවර හා ජලජීවී වගා කටයුතු කළමනාකරණය කිරීම සඳහා උපදේශන සභාවක් පිහිටුවීම
7. නීති විරෝධී ධීවර කටයුතු අධෛර්යමත් කිරීම, සාගර දූෂණය අවම කිරීම සහ හදිසි අවස්ථාවන්හි දී කඩිනම් ප්‍රතිචාර දැක්වීම හා සාගර ආපදා අවම කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
8. නිල් ආර්ථික ප්‍රවේශයක් තුළින් සාගර සම්පත් වල තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ නවීන සාගර කර්මාන්තයන් ස්ථාපිත කිරීම
9. විවිධ උෂ්ණත්වයන් යටතේ හා විවිධ ගැඹුරු මට්ටම්වල දී මත්ස්‍ය සම්පත නෙලා ගැනීමට ධීවර ප්‍රජාව වෙත තාක්ෂණික සහාය ලබා දීම
10. ධීවර වරායන් සහ දැල් තොටමුණ ඇතුළු පාරම්පරික ධීවර බිම්වල හිමිකාරිත්වය සහ ප්‍රවේශය සහතික කිරීම සහ එම යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
11. සාගර ධීවර කර්මාන්තය නැවත පණ ගැන්වීම සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය සැපයීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සහ නිෂ්පාදන පිරිවැය අඩු කර බිඳ වැටී ඇති ධීවර කර්මාන්තය නඟා සිටුවීම සඳහා ඉන්ධන සහනාධාරය ලබාදීම

12. නව, පරිසර හිතකාමී මෙන්ම ඵලදායී ධීවර තාක්ෂණයන් හඳුන්වා දීම
13. ධීවර යාත්‍රා කාර්ය මණ්ඩල සහ ධීවර යාත්‍රාවන් විදේශ මුහුදු ප්‍රදේශවල දී ගැටලු වලට මුහුණ දෙන හදිසි අවස්ථා වලදී කාර්යක්ෂම සහ විධිමත් රාජ්‍යතාන්ත්‍රික මැදිහත්වීම් සිදු කරන බව සහතික කිරීම
14. මත්ස්‍ය නිෂ්පාදන සඳහා විදේශ වෙළඳපොළ තුළ ඉහළ වටිනාකමක් ලබා ගැනීමට සහ වෙළඳපොළ කොටස වැඩිකර ගැනීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දීම
15. ඉහළ ඉල්ලුමක් සහිත හා අවම පරිභෝජනයකින් යුත් මුහුදු පැලෑටි නිෂ්පාදනය විවිධාංගීකරණය කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දීමට කටයුතු සැලසීම සහ එකී නිෂ්පාදන සඳහා වෙළඳපොළ සොයා ගැනීම පිණිස මැදිහත් වීම
16. අභ්‍යන්තර ජල මූලාශ්‍ර ජාලය උපයෝගී කර ගනිමින් මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සහ ව්‍යාප්ත කිරීම
17. වාණිජ අරමුණෙන් මිරිදිය මත්ස්‍ය අස්වනු ලබාගැනීම උදෙසා නවීන තාක්ෂණයෙන් යුත් විශාල පරිමාණයේ ගොවිපළවල් පිහිටුවීමට ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා මූල්‍ය සහාය සැපයීම
18. විසිතුරු මත්ස්‍යයන් හා ජලජ ශාක නිෂ්පාදනය හා අපනයනය ප්‍රවර්වධනය කිරීම
19. විසිතුරු ජලජ ශාක නිෂ්පාදන ක්‍රම සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහාය ලබාදීමට කටයුතු සැලසීම
20. ධීවර යාත්‍රා කළමනාකරණය සහ මෙහෙයවීම
21. පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට සාධාරණයක් වන පරිදි මත්ස්‍ය නිෂ්පාදන අලෙවි කටයුතු පුළුල් කිරීම
22. අන්තර්ජාතික මුහුදු ප්‍රදේශයේ මසුන් ඇල්ලීම පුළුල් කිරීම සඳහා දේශීය සමාගම්වලට අවස්ථාව ලබාදීම
23. දේශීය ටින් මාළු කර්මාන්තය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම
24. ධීවර කර්මාන්තය ආශ්‍රිතව ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දිරිමත් කිරීම
25. ධීවර ප්‍රජාවගේ සුභසාධන කටයුතු පුළුල් කිරීම හා ඵලදායී බැංකු සහ රක්ෂණ ක්‍රම හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම හඳුන්වාදීම
26. සාගර විශ්ව විද්‍යාලය හා සම්බන්ධ වී ධීවර කටයුතු පිළිබඳ තාක්ෂණික හා කළමනා කරණ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
27. සමුද්‍ර, කිවුල් දිය (කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංර්වධනය හා කළමනාකරණය
28. බහු දින ධීවර යාත්‍රා සඳහා මුහුදු ජලය භාවිතා කර ශීතකරණ පද්ධති සංර්වධනය කිරීම සහ සූර්ය බලශක්තිය භාවිතය දිරිමත් කිරීම
29. ධීවර වරායවල් සහ නැංගුරම් පොලවල් පිහිටුවීම, නඩත්තුව සහ කළමනාකරණය
30. ධීවර කර්කමාන්තය වෙනුවෙන් අවශ්‍ය වන අයිස් යන්ත්‍රාගාර, ශීත කාමර සහ යටිතල පහසුකම් දියුණු කිරීම හා නඩත්තු කටයුතු
31. මාළු හා මාළු ආශ්‍රිත නිෂ්පාදන වෙළඳාම හා බෙදාහැරීම
32. ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශට අනුබද්ධ ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
33. ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශට අනුබද්ධ ආයතනයන් අධීක්ෂණය කිරීම

1.4. සංවිධාන සටහන


සිවිල්, ප්‍රදේශ සහ සාගර සම්පත් අමාත්‍යාංශය - සංවිධාන ව්‍යුහය
ලේකම්
අතිරේක ලේකම් (ඉඩම් සම්පත් කළමනාකරණ) ශ්‍රී.ප.සේ.
අතිරේක ලේකම් (ඉඩම් සම්පත් කළමනාකරණ) ශ්‍රී.ප.සේ.
අධ්‍යක්ෂ (ඉඩම් සම්පත් කළමනාකරණ)
වි. අධ්‍යක්ෂ/ ස. අධ්‍යක්ෂ (ඉඩම් සම්පත් කළමනාකරණ) දෙපා.
සහායක කාර්ය මණ්ඩලය
අතිරේක ලේකම් (සංවර්ධන I) ශ්‍රී.ප.සේ.
අතිරේක ලේකම් (සංවර්ධන II) ශ්‍රී.ප.සේ.
අධ්‍යක්ෂ (සංවර්ධන) ශ්‍රී.ප.සේ.
වි. අධ්‍යක්ෂ/ ස. අධ්‍යක්ෂ (ප්‍රදේශීය සංවර්ධන නිලධාරී) ශ්‍රී.ප.සේ.
වි. අධ්‍යක්ෂ/ ස. අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන) ශ්‍රී.ප.සේ.
සහායක කාර්ය මණ්ඩලය
අතිරේක ලේකම් (ඛනිජ වාරිමාර්ග සම්පත්) ශ්‍රී.ප.සේ.
ජ්‍යෙෂ්ඨ ඝනකාර ලේකම් ශ්‍රී.ප.සේ.
ඝනකාර ලේකම් ශ්‍රී.ප.සේ
සිතියම් නිලධාරී ලේ.ප.
පරිපාලන නිලධාරී කළ.නි.සේ.නි.සේ
සහායක කාර්ය මණ්ඩලය
අධිකෂ්ක ජනරාල් (භූමිලේඛනාදේ) ශ්‍රී.ල.භූ.සේ.
අධ්‍යක්ෂ (භූමිලේඛනාදේ) ශ්‍රී.ල.භූ.සේ.
වි. අධ්‍යක්ෂ/ ස. අධ්‍යක්ෂ (ඵලපුම්) ශ්‍රී.ල.භූ.සේ
වි. අධ්‍යක්ෂ/ ස. අධ්‍යක්ෂ (අයිතිලේඛ) ශ්‍රී.ල.භූ.සේ
සහායක කාර්ය මණ්ඩලය
අධිකෂ්ක ජනරාල් (මූ.ජී.සේ.) ශ්‍රී.ල.මූ.සේ.
අධ්‍යක්ෂ (මූ.ජී.සේ.) ශ්‍රී.ල.මූ.සේ.
මූ.ජී.සේ.(02) ශ්‍රී.ල.මූ.සේ
සහායක කාර්ය මණ්ඩලය
අධිකෂ්ක ජනරාල් ශ්‍රී.ල.කා.සේ.
සහායක කාර්ය මණ්ඩලය
ප්‍රධාන ඉංජිනේරු ශ්‍රී.ල.ඉ.සේ.
ප්‍රධාන ගණකාධිකාරි ශ්‍රී.ල.ග.සේ.
ගණකාධිකාරි (ඵලපුම්) ශ්‍රී.ල.ග.සේ.
ගණකාධිකාරි (ගෙවීම්) ශ්‍රී.ල.ග.සේ.
සහායක කාර්ය මණ්ඩලය
ප්‍රධාන අභ්‍යන්තර විගණක ශ්‍රී.ල.ග.සේ.
අභ්‍යන්තර විගණක ශ්‍රී.ල.ග.සේ.
සහායක කාර්ය මණ්ඩලය

1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

I. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව(DFAR)

1.6. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන / අරමුදල්

I. ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය(NARA)
II. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය(NAQDA)
III. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව(CFHC)
IV. ලංකා ධීවර සංස්ථාව(CFC)
V. සීමාසහිත සීනෝර් පදනම (Cey-nor)
VI. නෝත් සී ලිමිටඩ (North sea Ltd)
VII. පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපල සංකීර්ණය

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා		
ව්‍යාපෘති යෝජනාව	මුදල (ඇ.ඩො.මි.)	වර්ථමාන ප්‍රගතිය
ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රජාවන්හි ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා වගා පාදක මිරිදිය ධීවර කර්මාන්තය ස්වයං තිරසාර ලෙස සංවර්ධනය කිරීම	3.0	මේ යටතේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව ඉහළ නංවන අතර තිරසාර බව ශක්තිමත් කරනු සඳහා මත්ස්‍ය බීජ අභිජනන ධාරිතාවය වැඩිකිරීම සඳහා මඩකලපුව, අනුරාධපුර සහ මොණරාගල දිස්ත්‍රික්කවල ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනනාගාර 3ක් ස්ථාපිත කිරීම, පවතින ජලජීවී මධ්‍යස්ථාන 4ක් වැඩිදියුණු කිරීම (ඉඹිනියාගල, ඉරණමඩු, උඩවලව, දඹුල්ල) සහ ප්‍රජා මූලික කුඩා පරිමාණ මත්ස්‍ය අභිජනන ඒකකයක් (එක්ගල්ඔය) වැඩිදියුණු කිරීම, තෝරාගත් ජලාශවල මත්ස්‍ය ඇඟිල්ලන් ගහණය වැඩිකිරීම, මව් මත්ස්‍ය ගහණය වර්ධනය කිරීම, ධීවර ප්‍රජාවන් අතර කූඩු තුල මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය කිරීම ආදී වැඩසටහන් සැලසුම් කර ඇත.
ධීවර කර්මාන්තයේ පසුඅස්වනු හානි අවම කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම	7.8	නවීකරණය කරන ලද බහුදින යාත්‍රාව සාර්ථක අත්හදා බැලීම් දෙකක් සිදු කර ඇති අතර මෙම ව්‍යාපෘතිය යටතේ නව තාක්ෂණික ක්‍රමවේදයන් සියල්ල සහිතව නිෂ්පාදනය කරන ලද ධීවර යාත්‍රාවක් නව උපාංග සමඟ ප්‍රථම ධීවර ගමන සඳහා දියත් කිරීම දික්ඕවිට ධීවර වරායේදී 2024.10.24 දින සිදු විය.
ඵලදායී ජෛව ආරක්ෂාව සහ ඩිජිටල් තාක්ෂණය තුළින් සුහුරු සහ තිරසාර ජලජීවී වගාව	1.2	2022.10.27 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD)අනුමැතිය ලැබී ඇත. ජෛව ආරක්ෂාව (BS) සහ විශාල දත්ත (BD) පිලිබඳව තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් (TWG) ස්ථාපනය කිරීම මෙමඟින් සිදු කෙරිණි.
මුහුදු කූඩැල්ලන් ජලජීවී වගාව සහ ක්ෂය වූ ,ජලජ සම්පත් සැකසීම, නැවත ගබඩා කිරීම සහ කළමනාකරණය සඳහා	2.0	2022.10.20 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙහි (NPD) අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක තත්වයේ පවතී.

තාක්ෂණික සහාය		

ජාත්‍යන්තර සංවර්ධන සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනයේ (USAID) ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා

ව්‍යාපෘති යෝජනාව	මුදල (ඇ.ඩො.මි)	වර්ථමාන ප්‍රගතිය
කාලගුණ හා දේශගුණික විපර්යාසයන් මඟින් ධීවර ක්ෂේත්‍රය වෙත ඇතිකරන බලපෑම්වලට අවම කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) මඟින් ප්‍රධානයක් ලෙස උම්බලකඩ වියලීමේ යන්ත්‍ර 4ක් ලබා දීම.	0.087	දකුණු පලාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කුඩාවැල්ල ප්‍රදේශයේ උම්බලකඩ නිෂ්පාදකයන් 4 දෙනෙකු සඳහා උම්බලකඩ වියලීමේ යන්ත්‍ර ලබා දීම සඳහා ප්‍රතිලාභීන් තෝරාගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ඒ පිළිබඳව 120 දෙනෙකුට පුහුණුව ලබාදීමට අපේක්ෂිත අතර කාර්මික සේවා කාර්යාංශය (Industrial service Bureau – ISB) මඟින් අදාල උපකරන සකස් කිරීම නාරා ආයතනය හා එක්ව සිදු කළ අතර මෙම ව්‍යාපෘතිය අතර මඟ නවතා දමන ලදී.

තායිලන්ත රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා

ව්‍යාපෘති යෝජනාව	මුදල (රු.මි.)	වර්ථමාන ප්‍රගතිය
සාගර විසිතුරු මත්ස්‍ය අභිජනනය පිළිබඳ පුහුණුව සහ විශේෂඥ සේවය	54	ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් තෝරාගත් විසිතුරු මත්ස්‍ය අභිජනනකරුවන් 10 දෙනෙකුට තායිලන්තයේ පුහුණුව ලබාදී ඇත

ජපන් රජයේ (ජපන් ජාත්‍යන්තර සහයෝගිතා පද්ධතිය - Japan International Cooperation System - JICS) ආධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති යෝජනා

ව්‍යාපෘති යෝජනාව	මුදල (ඇ.ඩො.මි)	වර්ථමාන ප්‍රගතිය
උතුරු හා නැගෙනහිර පලාත්වල ධීවර කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම.	3	අංක NPD/AGC/PP/FIS/2023/05 යටතේ 2023.07.04 දිනැති ලිපිය මඟින් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ (NPD) අනුමැතිය ලැබී ඇත. අදියර 2ක් යටතේ උපකරණ ලබා දීමට නියමිතය. පළමු අදියර යටතේ ධීවර කටයුතු ප්‍රවර්ධනය සහ ශීත කටයුතු වලට අදාළ ව පහත උපකරණ ලබාදීම සිදුකරනු ලබයි. - Ice Making Machine - Digital Platform Scale - Fishing Net, Refrigerator - Cargo Truck - Prefabricated Refrigerator/ Freezer දෙවන අදියර යටතේ ධීවරයින්ගේ ආරක්ෂාවට අදාළව පහත උපකරණ ලබාදීම සිදුකෙරේ. - Patrol Boat - Rigid Hull Inflatable Boat (RIB) - Lighted Buoy - HF Radio Transceiver (ජපාන මූල්‍ය වර්ෂය අප්‍රේල් සිට මාර්තු දක්වා ක්‍රියාත්මක වේ, එබැවින් එය එම මුදල් වර්ෂය සඳහා වන ව්‍යාපෘතියකි).

02 - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

ජයග්‍රහණ

- උතුරු පළාත තුළ 2024 වර්ෂයේ අයවැය මඟින් රු. මිලියන 500ක ප්‍රමාණයක් වෙන් කරවාගෙන මන්නාරම, මුලතිව්, කිලිනොච්චි හා යාපනය දිස්ත්‍රික්කයන්හි ධීවර තොටුපොළ 62ක් ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ධීවර කටයුතුවලට පමණක් සීමා කොට තිබූ ගන්දර ධීවර වරාය ව්‍යාපෘතිය සංචාරක, ධීවර, සමාජ සංවර්ධන ආදී බහුවිධ ක්ෂේත්‍රන්හි ප්‍රතිලාභ අත්පත් කරගත හැකි ධීවර වරායක් බවට පත් කිරීම සඳහා කටයුතු කිරීම.
- පසුගිය වසරට සාපේක්ෂව ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් කොග්ගල කලපුව තුළ මිරිදිය ඉස්සන් පසු කීටයන් (Post-Larvae) මිලියන 5කට අධික ප්‍රමාණයක් තැන්පත් කිරීමට කටයුතු කිරීම.
- විදේශ ආධාර ව්‍යාපෘතියක් යටතේ ධීවර යාත්‍රා සඳහා සිසිලන පද්ධතියක් සහ බල්බස්බෝ උපාංගයක් නිර්මාණය කිරීම.
- විවිධ පාරිසරික බලපෑම් නිසා වසර 8ක පමණ සිට අසාර්ථක වී තිබූ රැකව ප්‍රදේශයේ පිහිටි කකුළුවන් සඳහා සැකසූ ගොවිපොළ, පෞද්ගලික ආයෝජකයෙකු වෙත ලබා දී ඉස්සන් ගොවිපොළක් බවට පරිවර්තනය කර වැඩි දියුණු කොට විදේශ විනිමය ඉපැයීම සඳහා දායක කර ගැනීමට හැකිවීම.
- අලාභ ලබන තත්ත්වයේ තිබූ ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව සතු අයිස් යන්ත්‍රාගාරය පෞද්ගලික ආයෝජකයෙකු සමඟ එක්ව ලාභ ලබන තත්ත්වයට පත් කර ගැනීමට කටයුතු කිරීම.

අභියෝග

- විවිධ භෞතික සාධක හේතුවෙන් අක්‍රිය තත්ත්වයේ පවතින ඔලුවිල් ධීවර වරාය ජාතික ආර්ථිකයට දායක කරගත හැකි පරිදි සක්‍රිය මට්ටමකට ගෙන ඒම.
- ඔලුවිල් ධීවර වරායේ මත්ස්‍ය සැකසුම් මධ්‍යස්ථානය මෙතෙක් ආරම්භ කිරීමට නොහැකි වීම.
- ධීවර වරායන්හි දියකඩන වල එක් රැස්වන වැලි නිධි ඉවත් කිරීම ඉතා මිල අධික හා දුෂ්කර කටයුත්තක් වීම.
- ලංකා ධීවර සංස්ථාව, ලංකා වරාය නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, සීමාසහිත සීනෝර් පදනම සහ නෝර්ත් සී ලිමිටඩ් ආයතන දශක ගණනාවකට පෙර පැවති ලාභ ලබන තත්ත්වයට හා තිරසර, ස්ථාවර මට්ටමකට ගෙන එමින් ජාතික මට්ටමෙන් ජාත්‍යන්තර තත්ත්වයට පත් කිරීම.
- සියලු පාර්ශ්වකරුවන්ගේ එකඟතාව සහිතව ධීවර ක්ෂේත්‍රට අදාළ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ජලජීවී වගාව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය වගා බිම් ප්‍රමාණවත් නොවීම හා වගා බිම් පවරා ගැනීමට අරමුදල් සපයා ගැනීමේ දුෂ්කරතා.
- ජලජීවී වගාව සඳහා ප්‍රශස්ථ ඉඩම් වෙනත් කටයුතු සඳහා යොදවා ගැනීම.
- ධීවර ක්ෂේත්‍ර තුළ අවශ්‍ය පුරෝකථන සිදු කිරීම සඳහා ප්‍රමාණවත් හා නිවැරදි වූ දත්ත පද්ධතියක් යාවත්කාලීන කර නොමැති වීම.
- ධීවර ප්‍රජාව Clean Sri Lanka, දිළිඳුකම පිටුදැකීම, ඩිජිටල්කරණය වැනි වැඩසටහන් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා වන සංස්කෘතිමය බාධා ඉවත් කිරීමේ දුෂ්කරතා.
- ධීවර ක්ෂේත්‍රට අදාළ පාරිසරික අනුමැතීන් ලබා ගැනීම්, ලියාපදිංචි කිරීම් සහ බලපත්‍ර ලබා ගැනීම් සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් නොමැති වීමෙන් විවිධ ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කිරීම ප්‍රමාද වීම.

- ආකෘති මඟින් සකස් කරනලද ව්‍යාපෘති ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ආකෘතියේ ආකාරයටම ක්‍රියාත්මක නොවීම නිසා ව්‍යාපෘතියෙහි මූලික අරමුණ ඉටු නොවීම. මෙලෙස මූලික සැලැස්ම අසාර්ථක වීම හේතුවෙන් අමතර පිරිවැයක් සහ කාලයක් ගතවීම.
- අත්‍යාවශ්‍යම වන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමැතීන් නොලැබීම හේතුවෙන් සිදුව ඇති දුෂ්කරතා.
- ධීවර ආම්පන්න වල මිල උච්ඡාවචනය වීමෙන් සිදුවන විවිධ අපහසුතා ධීවර ප්‍රජාවට දරාගත නොහැකි වීමෙන් මත්ස්‍ය මිල සඳහා වන සෘජු බලපෑම.
- මත්ස්‍ය මිල තීරණය කිරීම සඳහා ලංකා ධීවර සංස්ථාව සහ පුද්ගලික අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රායෝගික අපහසුතා.

ඉලක්ක

- දැනට ඉදි කෙරෙමින් පවතින ගන්දර ධීවර වරායේ ඉදි කිරීම් කටයුතු අවසන් කර 2026 වසර වනවිට එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම. එමඟින් ජාත්‍යන්තර බෝට්ටු, සංචාරක කර්මාන්තය හා ඒකාබද්ධ වැඩසටහන් සඳහා අවස්ථාව ලබා දීමෙන් විදේශ විනිමය ඉපැයීමේ ක්‍රමවේද ජනප්‍රිය කිරීම.
- උතුරු පළාත තුළ ධීවර ක්ෂේත්‍රයේ උන්නතියට සුවිශේෂ බලපෑමක් සිදුකළ හැකි මයිලඩි ධීවර වරාය ඉදි කිරීම් කටයුතු වල III වන අදියර ආරම්භ කර 2026 වසර වන විට අංග සම්පූර්ණ ධීවර වරායක් ලෙස වැඩි දියුණු කිරීම.
- නව ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය මෙම වර්ෂය තුළ ක්‍රියාවට නැංවීම.
- ධීවර ක්ෂේත්‍රය තුළට වැඩි වශයෙන් රාජ්‍ය-පෞද්ගලික-මහජන හවුල්කාරිත්වය ලබා ගනිමින් සංවර්ධන කටයුතු සිදු කිරීම.
- සමාජ ආරක්ෂණ ක්‍රමවේද හරහා ධීවර කාන්තාවන් දේශීය ආර්ථිකයට හා විදේශීය නිෂ්පාදන සඳහා දිරි ගන්වමින් නව ධීවර සංස්කෘතියක් රට තුළ ඇති කිරීම.
- ධීවර ප්‍රජාවගේ දරුවන් වෙනුවෙන් ස්ථාපනය කරන ලද “දියවර කැකුළු” ඉතුරුම් යෝජනා ක්‍රමය නව්‍යත්වයෙන් ක්‍රියාත්මක කිරීම.
- දිවයින පුරා පිහිටා ඇති ධීවර තොටුපොළ, ධීවර නැංගුරම්පොළ හා ගොඩබෑම් ස්ථාන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් 10%කින් ඉහළ දැමීම.
- ආර්ථික ප්‍රතිලාභ උපරිම කරගත හැකි අයුරින් මෙම වසර තුළ ඔලුවිල් ධීවර වරායේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය ශක්‍යතා අධ්‍යනය සිදු කිරීම.
- මිරිදිය ධීවර කර්මාන්තයට පහසුකම් සැලසීම සඳහා දැනට පවතින මත්ස්‍ය අභිජනනාගාර වල ධාරිතාව පළාත් සභා සමඟ ඒකාබද්ධ වැඩසටහනක් ලෙස මෙම වසර තුළ ඇරඹීම.
- වාණිජමය වශයෙන් ජලජීවී වගා (මුහුදු කූඩැල්ලා, කකුළුවා, බෙල්ලා, ඉස්සා, පොකිරිස්සා වැනි මුහුදු ජීවීන්) සිදු කරන පෞද්ගලික අංශයේ ධාරිතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රමවේද සකස් කිරීම.
- පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට ලබාගත හැකි ජනප්‍රියම ප්‍රෝටීන ප්‍රභවය බවට මාළු ආශ්‍රිත නිෂ්පාදන පත් කිරීම.
- විදේශීය වෙළඳපොළ සඳහා වන මත්ස්‍ය නිෂ්පාදන වල ගුණාත්මක හා ජාත්‍යන්තර ප්‍රමිතියේ නිෂ්පාදන ප්‍රමාණාත්මකව ඉහල දැමීම.
- දළ දේශීය නිෂ්පාදිතයට ධීවර ක්ෂේත්‍රයේ සිදු කරන දායකත්වය ඉහළ නැංවීමට සහ මත්ස්‍ය අපනයනය හරහා ලබාගත හැකි විදේශ විනිමය ඉහළ නැංවීමට සිදු කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහා රාජ්‍ය-පුද්ගලික හා මහජන දායකත්වයන් ලබා දීමට පළාත් සභා, දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය කාර්යාල, පළාත් පාලන ආයතන ආදී රාජ්‍ය ආයතනවල සම්බන්ධීකරණ කටයුතු ශක්තිමත් කිරීම.
- ධීවර ක්ෂේත්‍ර සඳහා නිවැරදි හා යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් මෙම වසර තුළ හඳුන්වා දීම.
- Clean Sri Lanka වැඩසටහනට සමගාමීව දිවයින වටා පිහිටි ධීවර වරායන් පිරිසිදු හා නීල වරායන් (Blue Ports) බවට පරිවර්තනය කිරීමට වැඩසටහන් හඳුන්වා දී ධීවර ප්‍රජාව (ධීවර සමිති), පෞද්ගලික අංශය, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් ආයතන සමඟ ඒකාබද්ධ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.

3. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තක්ෂ 2024 රු.	2023 රු.
-	ආදායම් ලැබීම්			
-	ආදායම් බදු	1	-	-
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-
-	ජාත්‍යන්තර වෙළඳාම් මත බදු	3	-	-
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-
-	ආදායම් නොවන ලැබීම්			
-	භාණ්ඩාගාර අග්‍රිම		3,878,669,000	3,565,040,056
-	කැන්පතු		29,730,122	228,248,986
-	අත්තිකාරම් ගිණුම්		11,928,780	11,836,362
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		1,532,319,131	-
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		5,452,647,033	3,805,125,404
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		5,452,647,033	3,805,125,404
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		5,452,647,033	3,805,125,404
	අඩු කළා : වියදම්			
	පුනරාවර්තන වියදම්			
183,819,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	166,005,277	168,538,480
167,461,157	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	130,203,316	139,918,945
1,629,084,005	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,531,335,133	3,016,050,302
-	පොළී ගෙවීම්	8	-	-
1,629,843	වෙනත් පුනරාවර්තන වියදම්	9	665,842	330,833
1,981,994,005	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		1,828,209,568	3,324,838,560
	මූලධන වියදම්			
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	22,059,985	22,765,655
35,538,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	3,235,219,973	29,480,230
4,244,329,192	ප්‍රාග්ධන මාරුකිරීම්	12	467,567,966	208,203,412
551,509,005	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-
-	හැකියා වර්ධනය	14	655,711	938,631
1,500,000	වෙනත් මූලධන වියදම්	15	2,391,761,736	3,025,955,261
2,440,531,762	මුළු මූලධන වියදම් (උ)		6,117,265,371	3,287,343,189
7,273,407,959	කැන්පතු ගෙවීම්		104,855,738	250,528,213
	අත්තිකාරම් ගෙවීම්		10,530,295	10,672,434
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		115,386,033	261,200,647
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		8,060,860,972	6,873,382,396
9,255,401,964	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(2,608,213,939)	(3,068,256,992)
	අග්‍රිම ඇලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(2,609,006,004)	(3,068,256,992)
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		792,065	-
			(2,608,213,939)	-

1

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය	
		2024	**2023**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	4,230,025,299	994,254,549
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	20,929,237	22,327,722
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**4,250,954,536**	**1,016,582,271**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(368,960,161)	(441,895,227)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		4,230,025,299	994,254,549
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	389,097,333	464,222,949
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	792,065	-
මුළු වගකීම්		**4,250,954,536**	**1,016,582,271**

පිටු අංක 7 සිට 44 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 45 සිට 51 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාකාරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන්දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම:	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2025-02-27	දිනය : 2025.02.27	දිනය :
M.A.L.S.N.K. Manthrinayake (AAL) Secretary Ministry of Fisheries, Aquatic and Ocean Resources 2 Floor, New Secretariat Building, Maligawatte, Colombo 10	M.A.L.S.N.K. Manthrinayake (AAL) Secretary Ministry of Fisheries, Aquatic and Ocean Resources 2 Floor, New Secretariat Building, Maligawatte, Colombo 10	එච්.පී. සමන් ධර්මසිරි ප්‍රධාන ගණකාධිකාරි නව මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

		රුපියල්
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ඖෂධ, අධිභාර, දඩමුදල් සහ බිලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	1,532,319,131	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	29,727,590	37,722,183
අග්‍රිම ලැබීම්	3,878,669,000	3,565,040,056
අක්කිකාරම් අයකර ගැනීම්	11,398,332	10,775,840
කැන්පතු ලැබීම්	29,730,122	228,248,986
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**5,481,844,175**	**3,841,787,065**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	296,033,930	308,253,703
සහනාධාර සහ මාරුකිරීම්	77,804,004	141,945,094
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	43,626,087	33,544,769
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
අක්කිකාරම් ගෙවීම්	11,690,444	10,795,386
කැන්පතු ගෙවීම්	104,855,738	250,528,213
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**534,010,203**	**745,067,165**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,947,833,972**	**3,096,719,900**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවක්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අක්කර ගැනීම්	4,947,833,972	3,096,719,900
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,947,833,972**	**3,096,719,900**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(4,947,833,972)**	**(3,096,719,900)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

01. <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

02. <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

03. <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.
මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

04. <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

05. <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

06. <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

07. <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තු		එකතු කරන ලද ආදායම්	
		මුල් ඇස්තමේන්තු	අවසන් ඇස්තමේන්තු	ප්‍රමාණය (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002-02-99	පොලිය - අනෙකුත්	960	960	973	101%
2003-02-99	පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ	20,000	20,000	22,653	113%
2004-01-00	වැන්දඹු හා අනාතදරු දායක මුදල්	-	-	6,102	0%

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්‍ෂ වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	1,781,000	1,981,994	1,828,210	92%
ප්‍රාග්ධන	4,819,000	7,273,408	6,117,265	84%

3.7. මුරෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තක්‍ෂ වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව	වොරන්ට් බලපත්‍ර නිකුත් කිරීම සඳහා	841	841	841	100%
02	අධ්‍යක්ෂ ජනරාල් , වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරන දෙපාර්තමේන්තුව	ගන්දර ධීවර වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ බලපත්‍රය අලුත් කිරීම	75	75	75	100%
03	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත්	කොළඹ වරාය බටහිර සහ නැගෙනහිර පර්යන්තය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාලව	501	501	12,240	27%

	දෙපාර්තමේන්තුව	ධීවර කර්මාන්තයට සිදු වූ බලපෑම අවම කිරීම සඳහා ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් යටතේ දෙහිවල කඩමත්ත යාත්‍රා තොටුපොල ආශ්‍රිතව කණුවක් ඉදිකර සූර්ය බලයෙන් ක්‍රියා කරන බීකන් පහනක් සවි කිරීමේ ව්‍යාපෘතිය සඳහා				
04	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	කොළඹ වරාය බටහිර සහ නැගෙනහිර පර්යන්තය පුළුල් කිරීමේ ව්‍යාපෘතියට අදාලව ධීවර කර්මාන්තයට සිදු වූ බලපෑම අවම කිරීම සඳහා ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් යටතේ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, 167 උස්වැටකෙයියාව ග්‍රාම නිලධාරී වසමේ, තල්දියවත්ත ලුනාව මසුන් ගොඩබෑමේ මධ්‍යස්ථානයේ දියකඩනය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා	45,000	45,000		
05	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	චීන සමූහාණ්ඩුව මඟින් ධීවර කාර්මිකයන් වෙත ලබාදෙන ලද සහල් තොග යාපනය, කිලිනොච්චිය, මුලතිව්, මන්නාරම යන උතුරු පළාත් ධීවර දිස්ත්‍රික්කවල ධීවර කාර්මිකයන් වෙත බෙදා හැරීමේ වියදම් සඳහා ප්‍රතිපාදන ලබා දීම	6,293	6,293	1,466	23%
06	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	කලපු පිරිසිදු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ පුත්තලම,හලාවත,නන්දිකඩාල් හා ලංකාපටුන යන කලපුවල කලපු කලමනාකරණ කමිටු ධීවරයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 23ක් පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම	502	502	2,149	72%
07	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	කලපු පිරිසිදු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ නන්දිකඩාල් කලපුවේ මායිම් කණු 76ක් සිටුවීම වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දීම	95	95		

08	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	කලපු පිරිසිදු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ හලාවත කලපුවේ ඇති නිෂ්පාදිත මායිම් කණු 2,276ක් පුත්තලම කලපුව වෙත ප්‍රවාහනය කිරීම සඳහා	1,996	1,996		
09	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	කලපු පිරිසිදු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ කලපු කළමනාකරණ කමිටු ධීවරයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ලබා දීම	243	243		
10	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	කලපු පිරිසිදු කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ වැඩසටහන යටතේ ආරුගම්බේ කලපු ගැඹුරු කර පිරිසිදු කිරීමට අදාල මූලික පාරසරික අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් සලකා බැලෙන කටයුතු සඳහා	150	150		
11	අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා රේගුව	චීන සමූහාණ්ඩුව මඟින් ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පලාත්වල කුඩා පරිමාණ ධීවරයන් සඳහා ලැබුණු ද්‍රව්‍ය තොගය ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා ලබා දුන් ප්‍රතිපාදන	703,607	703,607	703,607	100%
12	දිස්ත්‍රික් ලේකම්,කළුතර	එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම	1,870	1,870	1,847	99%
13	දිස්ත්‍රික් ලේකම්,කොළඹ	එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම	7,047	7,047	6,875	98%
14	දිස්ත්‍රික් ලේකම්,ගම්පහ	එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම	52,642	52,642	44,993	85%
15	අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව	එක්ස්ප්‍රස් පර්ල් නෞකාව ගිනි ගැනීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ පුද්ගලයින් සඳහා වන්දි ගෙවීම ඇතුළු පරිපාලන	51,647	51,647	49,147	95%

		කාර්යයන් කිරීම වෙනුවෙන් අදාල දීමනා ගෙවීම				
16	ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය	පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2024 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබාදුන් භාණ්ඩාගාර දායකත්වය	947,874	947,874	915,009	97%
17	ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය	පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2024 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබාදුන් භාණ්ඩාගාර දායකත්වය	600,000	600,000	485,560	81%
18	ලංකා ධීවර වරාය නිතිගත සංස්ථාව	පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා 2024 අනුමත අයවැය ඇස්තමේන්තුවෙන් ලබාදුන් භාණ්ඩාගාර දායකත්වය	400,000	400,000	399,994	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.000

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		3,096,289		
9152	යන්ත්‍රෝපකරණ		349,250		
9153	ඉඩම්		608,068		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-		
9160	කෙරීගෙන යන වැඩ		176,419		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම I

4. කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	90% - 100%	75% - 89%	50% - 74%	
2024 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 330,000 දක්වා වැඩි කිරීම	√			$\frac{308,430}{330,000}$ X 100 = 93.46%
2024 දී දේශීය ජලජීවී වගා මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 173,000. දක්වා වැඩිකිරීම			√	$\frac{102,330}{173,000}$ X 100 = 59.15%
එක් දිනක් තුළ ග්‍රෑම් 34 දක්වා ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය වැඩි කිරීම	√			$\frac{36.85}{34}$ X 100 = 108.38%

5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය			
			0% - 49%	50%- 74%	75%- 100%	
තිරසාරසංවර්ධන ඉලක්කය14 (තිරසර සංවර්ධනය පිණිස සාගර, මුහුදු හා සාගර සම්පත් සංරක්ෂණය හා ධරණීය භාවිතය.)	2024 දී සමුද්‍ර මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. 330,000 කි.	මෙ.ටො 308,430			√	$\frac{308,430}{330,000}$ X 100 =93.46%
	2024 දී මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො 173,000 කි	මෙ.ටො. 102,330		√		$\frac{102,330}{173,000}$ X 100 =59.15%
	2024 දී ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට ග්‍රෑම් 34 දක්වා වැඩි කිරීම.	දිනකට ග්‍රෑම් 36.85			√	$\frac{36.85}{34}$ X 100 = 108.38%
තිරසර සංවර්ධන ඉලක්ක 12 (තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවක් සහතික කිරීම.)	මත්ස්‍ය අපනයන ආදායම වැඩිකිරීම 2024 වසරේදී ඇ.ඩො.මි.315 දක්වා වැඩි කිරීම	ඇ.ඩො.මි. 285.2			√	$\frac{285.2}{315}$ X 100 = 90.53%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

14.7.1, ඉලක්කය, 2030 වන විට ධීවර, ජල ජීවී වගාව සහ සංචාරක කර්මාන්තයේ තිරසාර කළමනාකරණය තුළින් සාගර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීමෙන් ආර්ථික ප්‍රතිලාභ වැඩිකර ගැනීම.
දර්ශකය14.7.1 : කුඩා රාජ්‍යයන්, අඩු සංවර්ධිත රටවල් සහ සියලුම රටවල දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ධීවර කටයුතු (ප්‍රරොක්සි දර්ශකය)

දර්ශකය	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
අගය එකතු කරන ලද කරදිය මත්ස්‍ය ධීවර කර්මාන්තය (%)	1.3	1.3	1.2	1.0	1.1	0.9	0.9	1.0	1.0
අගය එකතු කරන ලද මිරිදිය ධීවර හා ජලජීවී වගාව (%)	0.1	0.1	0.1	0.2	0.2	0.2	0.2	0.2	0.2
ධීවර හා ජලජීවී වගාවෙහි දළ දේශීය නිෂ්පාදිතය (GDP)	1.4	1.4	1.3	1.2	1.3	1.1	1.1	1.2	1.2

මූලාශ්‍රය: සංඛ්‍යාලේඛන අංශය, ධීවර අමාත්‍යාංශය – 2020-2021 / තිරසර සංවර්ධන සභාව

ඉලක්ක 14.b, කුඩා පරිමාණ ශිල්පීය ධීවරයින් සඳහා සමුද්‍ර සම්පත් සහ වෙළඳපල වෙත ප්‍රවේශය ලබාදීම.
ඉලක්ක 14.b.1, නීතිමය/ නියාමන/ ප්‍රතිපත්තිමය/ ආයතනික රාමු ප්‍රස්ථාරයක යෙදවුම් ප්‍රමාණය හඳුනා ගැනීම සහ කුඩා පරිමාණ ධීවර කර්මාන්තය සඳහා ප්‍රවේශ අයිතීන් ආරක්ෂා කිරීම.

	2022	2023	ඉලක්ක ගත 2030
1. විශේෂයෙන් කුඩා පරිමාණ ධීවර ක්ෂේත්‍ර ඉලක්ක කරගත් හෝ ඊට අදාළව නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සැලසුම් හෝ උපායමාර්ග පැවතීම.	40%	40%	100%
1. SSF මාර්ගෝපදේශය ක්‍රියාවට නැංවීම සඳහා දැනට ක්‍රියාත්මක විශේෂිත මුලපිරීම්	30%	30%	100%
කුඩා පරිමාණ ධීවරයින් සහ මත්ස්‍ය කම්කරුවන් කුඩාපරිමාණ ධීවර කර්මාන්තය සඳහා කළමනාකරණ සැලසුම් සංවර්ධන තීරණ ගැනීමේ ක්‍රියාවලිය ආරම්භකිරීමටදායක වන යාන්ත්‍රණයක් පැවතීම.	30%	35%	100%

මූලාශ්‍රය: ධීවර දෙපාර්තමේන්තුව / තිරසර සංවර්ධන සභාව

ඉලක්ක 14.6- 2023 වනවිට අධි ධාරිතාවට සහ අධික ලෙස මසුන් ඇල්ලීමට දායක වන ඇතැම් ආකාරයේ ධීවර සහනාධාර තහනම් කිරීම, නීතිවිරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීමට දායකවන සහනාධාර ඉවත්කිරීම සහ එවැනි නව සහනාධාර හඳුන්වාදීමෙන් වැළකීම, ලෝක වෙළඳ සංවිධානයේ ධීවර සහනාධාර සාකච්ඡාවල උෆන සංවර්ධිත රටවල් සංවර්ධනය සඳහා සුදුසු සහ ඵලදායී විශේෂ සහ අවකලා්‍ය ක්‍රමවේද පිළිබඳව සාකච්ඡාව අනිවාර්ය අංගයක් විය යුතු බව හඳුනා ගැනීම.

14.6.1 දර්ශක- නීතිවිරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීමට එරෙහිව සටන් කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර උපකරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණය (දර්ශකය)
ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය පිළිබඳ ඉන්දියානු සාගර ටූනා කොමිසම විසින් අදාළ නීති සහ ගිවිසුම්වලට අනුකූල වීමේ අනුපාතය

වසර	අනුකූලතා අනුපාතය
2010	5%
2011	18%
2012	47%
2013	51%
2014	60%
2015	74%
2016	77%
2017	82%
2018	87%
2019	90%
2020	86%
2021	76%
2022	83%
2023	78%

5.2.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට ඇති අභියෝග

1. මෙම කාල පරාසය තුලදී ඇතිවූ ඉන්ධන හිඟ තත්වය, ඉන්ධන මිල ඉහළ යාම,ශ්‍රම වියදම ඉහළ යාම හා අයිස් වැනි යෙදවුම් අමුද්‍රව්‍ය වල මිල ඉහළ යාම, ධීවර දැල් ආදී ධීවර ආම්පන්න මිල ඉහළ යාම හේතුවෙන් ධීවරයින් මත්ස්‍ය කර්මාන්තයට දක්වන රුචිකත්වය අඩුවීම.

2. වෙරළබඩ සම්පත් බොහොමයක් විද්‍යාත්මක සාක්ෂි නොමැතිව දූර්වල ලෙස කළමනාකරණය කර ඇත.ඇතැම් අවස්ථා වල සම්පත් භාවිත කරන්නන් දූර්වල ලෙස අධීක්ෂණය කිරීම තුළින් සම්පත් අධික ලෙස සූරාකෑම සහ විනාශ වීම සිදු වේ.එබැවින් කළමනාකරණය කරන්නන්ගේ සහ පරිශීලනය කරන්නන්ගේ සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ ආකල්ප වර්ධනය කළ යුතුය. මීට අමතරව පවත්නා නීතිය බලාත්මක කිරීමට බලාක්මක කිරීමේ නිලධාරීන්ට නිසි දැනුම හෝ පහසුකම් ලබා දීම අවශ්‍යව ඇත.

3. ධීවර හා සාගර අංශ සම්බන්ධ නවීන පර්යේෂණ ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීමට තාක්ෂණික හා මූල්‍යමය බාධා හේතු වී ඇත. සාමාන්‍ය ජනතාව අතර සමුද්‍ර පරිසර පද්ධති වල වටිනාකම පිළිබඳ දූර්වල දැනුවත්භාවය ඒවා විනාශ වීමට හේතු වේ. විවිධ ආයතන අතර කාර්යභාරයන් එකිනෙක අතපසු වී පැවතීම තුළ අවසානයේ කිසිවෙකු වගකීම භාර නොගනී. ශ්‍රී ලංකාවේ සාගර හා වෙරළබඩ සම්පත් කළමනාකරණය සඳහා ආයතන අතර ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් නොමැතිවීම බරපතල කාරණයකි.

4. නීති විරෝධී හා හානිදායක පරිදි මසුන් ඇල්ලීමේ අවදානමක් පැවතීම.

5. ධීවර කර්මාන්තය නැවත ප්‍රතිෂ්ඨාපනයෙහි දූර්වලතා.

6. කලමනාකරණය සහ මත්ස්‍ය වෙළඳාම සඳහා වන අන්තර්ජාතික අවශ්‍යතා සපුරා ගැනීමේ ගැටළු.

7. ධීවර ජනතාවගේ ධීවර කටයුතු වල අඛණ්ඩ තිරසාර භාවය පිළිබඳ අවිනිශ්චිතතාව

8. සම්පත් අධික ලෙස උකහා ගැනීම සහ විනාශවීම.

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය (2024.12.31 වන දිනට)

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	30	21	09
තෘතීයික	04	03	01
ද්විතියික	164	95	69
ප්‍රාථමික	40	37	03
වෙනත්	03 (තාවකාලික)	01	02

6.2. ****ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇති ආකාරය.**

පවත්නා පුරප්පාඩු නොතකා, වර්තමාන කාර්ය මණ්ඩලයට කාර්යක්ෂමව රාජකාරි ඉටුකිරීමට හැකිවී තිබේ. සේවාව තවුරටත් වැඩිදියුණු කිරීම සඳහා පුරප්පාඩු පුරවාලීමට අදාල බලධාරීන්ට ඉල්ලීම් කර ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (Rs. '000)		වැඩසටහනෙ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
වෘතීමය ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව – 2023 ඒ.පී. මල්ලිකාරච්චි මහතා සඳහා පළමු බඳවා ගැනීම (AD)	01		92,000		දේශීය	පුහුණු විෂය ක්ෂේත්‍රවල සමස්ත ඵලදායිතාවඉහළ නංවා ඇත.
විශ්‍රාම වැටුප් පිළියෙල කිරීමේ පුහුණු වැඩසටහන	02	දින 02	26,000		දේශීය	
ලිපිගොනුකරනය පුහුණු වැඩසටහන	52	දින 01	12,800		දේශීය	
රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	80	දින 02	25,640		දේශීය	
ප්‍රසම්පාදන පුහුණු වැඩසටහන	80	දින 01	64,830		දේශීය	
නිපුනතා සංවර්ධන අරමුදල මඟින් සං.නි. හා කළ.සේ.නි.සඳහා පවත්වන ලද කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන	01	දින 02	13,000		දේශීය	
ප්‍රායෝගික කළමනාකරණ ක්‍රීඩා තුළින් ඵලදායී රාජ්‍ය සේවයක්	71	දින 01	21,000		දේශීය	

ප්‍රසම්පාදන පුහුණු වැඩසටහන දෙවන අදියර		දින 01	73,500		දේශීය	
Workshop on Advanced Excel - 2024	02		33,000		දේශීය	
වාර්ෂික ගබඩා සමීක්ෂණ පුහුණු වැඩසටහන	02	දින 01	27,000		දේශීය	
මූල්‍ය ප්‍රකාශන පාඨමාලාව	02		27,000		දේශීය	
Diploma in Professional English Course – 2024 1st Intake (2025) – Mrs. Priyanka Kodithuwakku (SAS)	01		92,000		දේශීය	පුහුණු විෂය ක්ෂේත්‍රවල සමස්ත ඵලදායිතාවඉහළ නංවා ඇත.
Higher National Diploma in Public Procurement and Contract Administration – Mr.H.P.S.Dharmasiri (CFO)	01		138,000		දේශීය	
Higher National Diploma in Public Procurement and Contract Administration – Ms.J.P.I.Swarnalatha (Deputy Director – Ocean Resources)	01		138,000		දේශීය	

7. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූලවේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම්	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
02	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2,2	පුද්ගල පඩිනඩි ලේඛණ/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2,3	විගණන විමසුම් ලේඛණය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත් කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	**මුල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	ආයතනය තුළ මුල්‍ය බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා තිබීම පිළිබඳව ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිතදිනටඉදිරිපත්කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	All audit inquiries have been answered so far.	
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. (134) (2) DMA/1-2019 අනුව, වසරආරම්භයේදීවිගණකාධිපතිවරයාසමඟ සාකච්ඡාකිරීමෙන්අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණවත්කම්කළමනාකරණචක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම.සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොන්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	ඉන්ධන සඳහා වන ප්‍රතිපාදන කලමනාකරණය කිරීම සඳහා ඉන්ධන දහනය පරීක්ෂා කිරීම ප්‍රමාද වූ අතර මෙම වර්ෂයේ පළමු කාර්තුව තුළ අවසන් කිරීමට කටයුතු කරමි.	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාල නැත	කල්බදු කාල සීමාවෙන් අනතුරුව අයිතිය පැවරෙන පරිදි	

			වාහන ලබාගෙන නොමැත	
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අක්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිනුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		

15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි /සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන	අනුකූල වේ		

	සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ (19.1 හි සඳහන්) 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩදටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩු පාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. FLS/B/MF/2/24/01

මඟෙ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date. 2025

Ministry of Fisheries, Aquatic and Ocean Resources Finance
29 MAY 2025
ධීවර අමාත්‍යාංශය
29 MAY 2025
ලේඛන භාරශාලාව

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

ශීර්ෂය- 151 ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශීර්ෂය- 151 - ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ වලින් මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන් I හි

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

සඳහන් වූ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණු සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකභාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සම්ස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) පරිගණක මුද්‍රිත සටහන් අංක SA 10 වියදම් සාරාංශ ආකෘතිය අනුව 2024 වර්ෂයේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමට අදාළව මූලධන වියදම් (2104) රු.2,617,782,669 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමට (Harbours dams and other water works) අදාළව 2024 වර්ෂයේ අත්පත් කර ගැනීම් ලෙස රු.2,615,558,561 ක් දක්වා තිබීමෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ මිලදී ගැනීම් වල රු.2,224,108 ක වෙනසක් පැවතුණි.

(ආ) 2023 භාණ්ඩ සම්ක්ෂණයට අදාළව අපහරණය කළ යුතු භාණ්ඩ 2024 ජූලි 25 දින වෙන්දේසි කර තිබූ අතර එම භාණ්ඩවල මුළු තක්සේරු වටිනාකම රු.79,770 ක් සහ වෙන්දේසි වූ මුළු වටිනාකම රු.168,820 ක් විය. එම අපහරණය කරන ලද භාණ්ඩ වල පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල SA 82 සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙන් ඉවත් කර නොතිබුණු අතර ඒ හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ වත්කම් ඉවත් කිරීම් ශේෂය නිවැරදි නොවීය.

1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

ප්‍රතිශෝධිත අයවැය ඇස්තමේන්තුව මඟින් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා පිළිවෙලින් රු.850,000,000 ක්වූ ප්‍රතිපාදන ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය වෙතද, රු.600,000,000 ක්වූ ප්‍රතිපාදන ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය වෙතද හා රු.400,000,000 ක්වූ ප්‍රතිපාදන ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙතද වෙන්කර දී තිබුණි. එමෙන්ම පරිපූරක ප්‍රතිපාදන මඟින් ධීවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු.97,874,000 ක අමතර ප්‍රතිපාදනයන් ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සඳහා වෙන්කර දී තිබුණි. මෙම රාජ්‍ය ආයතන 03 අමාත්‍යාංශය යටතේ නියාමනය වුවද 2024 වර්ෂය තුළ දී ලබා දී තිබුණු මෙම ප්‍රතිපාදන වලින් වියදම් කල රු. 1,800,563,766 ක් වූ මුදල සම්බන්ධයෙන් ඒවා වියදම් කළ ආකාරය පිළිබඳ විස්තර ඇතුළත්

වියදම් වාර්තා, තොරතුරු හා එම එක් එක් ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ වෙන වෙනම හඳුනාගත හැකි පරිදි පිළියෙල කල තොරතුරු හෝ වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එම වියදම්වල නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ තහවුරු කරගැනීමට නොහැකි විය. ධිවර අමාත්‍යාංශයේ 2024 වර්ෂයේ ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ධිවර විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම සඳහන් කර තිබුණ ද අමාත්‍යාංශය විසින් මෙම ආයතන පසුවිපරම් කිරීම හා ඇගයීම සිදුකර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ යොමුව	ක්‍රියාත්මක කර නොතිබූ නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.4	විගණනයට අවශ්‍ය විස්තර ඉදිරිපත් නොකිරීම	1.6.2

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

වැය විෂයන් 5ක් සඳහා සලසාගෙන තිබුණු රු.7,570,151 ක් වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

ධිවර අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන බැරකම් ලේඛනය අනුව 2024 දෙසැම්බර් 31 දිනට බැරකම් ශේෂය රු.1,190,000 ක්වූ අතර SA 92 භාණ්ඩාගාර සමුච්චිත බැදීම් බැරකම් වාර්තාව අනුව එදිනට බැරකම් ශේෂය රු.1,790,000 ක් වූයෙන් රු.600,000 ක වෙනසක් පැවතුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ. 104(1)	නාරාහේන්පිට, මුහන්දිරම් ඊ.බී.දාබරේ මාවතේ අංක 18/146 B දරන ස්ථානයේ පිහිටා තිබූ ඩිවර අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා වෙන්කර තිබූ නිල නිවස සඳහා ඩිවර අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයෙන් ලබා දී තිබූ සියලුම රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අස්ථානගත වී තිබෙන බව 2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් විගණනය වෙත වාර්තා කර තිබුණු අතර ගොඩනැගිල්ලේ සවිකර තිබූ දොර ජනෙල් අගුළු හා ගොඩනැගිල්ලේ සවිකිරීම්ද ගලවාගෙන ගොස් තිබුණි. ඒ අනුව මෙම නිල නිවස තුල තිබුණු රජයේ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සියල්ලම අස්ථානගත වී තිබීම සහ රජයේ ගොඩනැගිලිවලට හානි සිදු වී තිබීම නිසා රජයට සිදුවී තිබෙන රු.1,808.262ක පාඩුව පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඊට වගකිවයුතු පාර්ශව හඳුනාගෙන පාඩුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) මු.රෙ.396	2024 පෙබරවාරි මස 02 දින වවුවර් අංක P 2402/08/01 සඳහා යාපනය නගර සභාවේ නාගරික කොමසාරිස් වෙත නිකුත් කරන ලද චෙක් අංක 383030 දරන රු.46,020 ක් වටිනා චෙක්පත නිකුත් කර මාස 10 ක් ඉක්ම ගිය ද ගෙවීම් සඳහා ඉදිරිපත් වී නොතිබූ අතර එම චෙක්පත සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	ආයතනයේ සියලුම සංචිත වාහන සඳහා රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කළ යුතු වුවත් අමාත්‍යාංශයේ කිසිදු වාහනයක රාජ්‍ය ලාංඡනය මුද්‍රණය කර නොතිබුණි.

(ඇ)	2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව චක්‍රලේඛයේ 8(vii) වන වගන්තිය	එක් එක් මාසයේ දායක මුදල්, ඊළඟ මාසයේ 10 වන දිනට පෙර රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ලැබීමට සැලැස්වීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වුවද, 2023 අප්‍රේල් මස සිට 2023 නොවැම්බර් මස දක්වා වූ යිවර රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයෙන් අයකරගෙන තිබූ රාජ්‍ය සේවා අර්ථසාධක දායකය වූ රු.545,256 ක මුදලක් අංක 6000-0-0-18-0-151 දරන ව්‍යාවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් තැන්පතු ගිණුමේ ද, 2023 ජනවාරි සිට 2024 දෙසැම්බර් මස දක්වා වූ කාලය තුළ ද යිවර අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ අයකරගෙන තිබූ රාජ්‍ය සේවා අර්ථසාධක දායකය වූ රු.1,671,404 ක මුදලක් අංක 6000-0-018-045 දරන ව්‍යාවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවාගැනීම් තැන්පතු ගිණුම්වල රඳවා ගෙන තිබුණි.
(ඈ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය	චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.
(ඉ)	2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අනුව සෑම මූල්‍ය නොවන වත්කමක්ම සෑම වර්ෂ 5 කට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඊ)	2024 අප්‍රේල් 30 දිනැති අංක 02/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 1 ඡේදය	2024 මැයි 15 දින සිට වාහන වටිනාකම් තක්සේරු කළ යුතු බව දක්වා ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(උ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12	වැව් බදු ආවරණය කිරීම සඳහා මුදල් ගෙවීමෙන් පසු, ඊළඟ මාසයේ 15 වන දින හෝ එදිනට පෙර, එම ගෙවීම් පිළිබඳ විස්තර, විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දන්වා යැවීමට කටයුතු කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එලෙස කටයුතු කර නොතිබුණි.

3.4 තැන්පතු

2023 වර්ෂයේ "සිවර දිනය 2023" වැඩසටහන සඳහා විවිධ ආයතන හා පුද්ගලයන් වෙතින් ලැබී තිබුණු අරමුදල් වලින් වැය නොකර ඉතිරි වූ රු.747,736 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

3.5 අත්තිකාරම් ගෙවීම්

(අ) 2015 පෙබරවාරි 02 වන දින සේවය හැරගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු එකතුව රු.113,610ක් වූ දේපල ණය ශේෂයක් සහ ආපදා ණය ශේෂයක් නිලධාරියා සේවය හැරගොස් වසර 10 ක් ගතව තිබුණ ද විගණිත දිනය වන විටත් අයකරගෙන නොතිබුණි.

(ආ) සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද එකතුව රු.662,263 ක් වූ වැටුප් හා දීමනා 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය වෙත අයවිය යුතුව පැවති අතර 2025 මාර්තු මස 28 දිනවන විටත් එම මුදල් අය කරගෙන නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

2024 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් සිවර අංශයේ යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ 1.1, 1.3, 1.4, 1.6 හා 1.7 දරන ව්‍යාපෘති 05 වෙනුවෙන් රු.82,500,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද ඊට අදාළ භෞතික කාර්යසාධනය ව්‍යාපෘති 04 ක සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවති අතර එක් ව්‍යාපෘතියක කාර්යසාධනය සියයට 50 ක් වී තිබුණි. එසේම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් වූ 1.5 ව්‍යාපෘතියට අදාළ භෞතික කාර්යසාධනය කොපමණ ද යන්න විගණනයේ දී අනාවරණය නොවිය.

4.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) 2023 දෙසැම්බර් 06 දින ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණු ගන්දර ධිවර වරාය ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් කාලය 2024 දෙසැම්බර් 23 දක්වා දින දිර්ඝ කරගෙන තිබුණි. එදින වනවිට ඉදිරිපත් කර තිබූ අන්තර් ගෙවීම් සහතික 38ක් (Interim Payment Certificate) සඳහා අමාත්‍යාංශය විසින් මුදල් ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් අදාළ කොන්ත්‍රාත් සමාගම වෙත 2024 දෙසැම්බර් 31 දින වනවිට රු.206,826,720 ක ප්‍රමාද පොලී ගෙවීම් කර තිබුණි. මෙලෙස අතිරේක ප්‍රමාද පොලී වියදම් සඳහා ද රජයේ ප්‍රතිපාදන මුදල් යෙදවීමට සිදුවීම තුළින් එම ප්‍රමාණයෙන් රජයට මූල්‍යමය අලාභයක් සිදු වී තිබුණි.

(ආ) ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය විසින් 2023/2024 වර්ෂයේ දී කලපු තුළ ඉස්සන් පසු කිටයන් තැන්පත් කිරීමේ ව්‍යාපෘතිය මගින් පසු කිටයන් 15,000,000 නිෂ්පාදනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණු අතර එම ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාව අනුව පසු කිටයන් 3,444,000 පමණක් තැන්පත් කර තිබුණි. ව්‍යාපෘතිය සඳහා යොදාගන්නා ලද අභිජනනාගාර තුළ ඉස්සන් පැටවුන් සහ මව් සතුන් රෝගකාරක වීම හේතුවෙන් මෙම සතුන් අභිජනනාගාරවලින් ඉවත්කර ජීවානුහරණය කිරීමට සිදුවීම නිසා උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 හා 2024 වර්ෂ වලදී අමාත්‍යාංශය විසින් රු.20,317,000 ක් වැය කර තිබුණු අතර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමකින් තොරව ව්‍යාපෘතිය අතරමග නවතා තිබුණි.

4.1.3 මානව සම්පත් සංවර්ධන සැලැස්ම

(අ) 2024 වර්ෂයේ මානව සම්පත් සංවර්ධනය සඳහා රු.783,700 ක මුදලක් වැයකර තිබුණු අතර එම මුදලින් සියයට 71 ක් එනම් රු.56,000ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 11 දෙනෙකුගේ පුහුණු කටයුතු වෙනුවෙන් වැයකර තිබුණි. මේ අනුව පුහුණු අවස්ථාවන් සමස්ථ කාර්යය මණ්ඩලය අතරේ සමාන ලෙස බෙදී ගොස් නොතිබුණි.

(ආ) සමස්ත නිලධාරීන් වෙනුවෙන් වැඩසටහන් 04 ක්ද, රියදුරන් වෙනුවෙන් වැඩසටහන් 02 ක්ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් වර්ෂය තුළ දී එම වැඩසටහන් ක්‍රියාත්මක වී නොතිබුණි.

4.2 ප්‍රසම්පාදනයන්

(අ) අමාත්‍යාංශයේ ධිවර වරාය ව්‍යාපෘති උපදේශක තනතුරු වන නැවත පදිංචිකිරීම් හා ඉඩම් පවරා ගැනීමේ විශේෂඥ, සහකාර ඉංජිනේරු සහ ප්‍රමාණ සම්පීක්ෂක යන තනතුරු සඳහා එක් තනතුරකට එක් අයදුම් පත්‍රය බැගින් ලැබී තිබුණි. උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සෘජුවම ඇතුළත් කර ඇති හෝ පුවත්පත් දැන්වීමට කැමැත්ත පළකර ඇති අපේක්ෂකයින් තිදෙනෙක් හෝ වැඩි ගණනක සුදුසුකම් සංසන්දනය කිරීමෙන් පුද්ගල උපදේශකයෙකු තෝරාගත යුතු වුවත්, අයදුම්පත් ඉදිරිපත් කළ එම තනි පුද්ගලයන් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. එසේම සේවා යෝජක නියෝජිත ව්‍යාපෘති ඉංජිනේරු තනතුර සඳහා අයදුම්කරුවන් දෙදෙනෙකුගෙන් එක් අයෙකු වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ඒ අනුව උපදේශන සේවා තනතුරු 04 සඳහා පුද්ගල උපදේශකවරු 04 ක් බඳවාගෙන කොන්ත්‍රාත් කාලය දිර්ඝ කරගනිමින් 2024 දෙසැම්බර් 31 දිනවන විට රු.20,724,925 ක් ගෙවීම් සිදුකර තිබුණි.

(ආ) ඉහත උපදේශක තනතුරු බඳවා ගැනීමට පලකළ 2021 අගෝස්තු 16 දින පුවත්පත් දැන්වීමෙහි ධිවර වරාය ව්‍යාපෘති සඳහා පුද්ගල උපදේශන සේවා ලෙස බඳවා ගැනීමට පළකර තිබුණ ද, ගිවිසුම් අත්සන් කිරීමේ දී ගන්දර ධිවර වරාය ව්‍යාපෘතිය සඳහා පම්ණක් පුද්ගල උපදේශකයින් ලෙස දෙපාර්ශවය විසින් ගිවිසුමට එළඹ තිබුණි. මේ හේතුවෙන් එම තනතුරු සඳහා නිවැරදි තොරතුරු ඇතුළත් කර පුවත්පත් දැන්වීම් පළනොකිරීම හේතුවෙන් මනා සුදුසුකම් ලත් උපදේශකයින් තෝරා ගැනීමට තිබූ අවස්ථා මගහැරී තිබුණි.

4.3 වත්කම් කළමනාකරණය

2022 දෙසැම්බර් 29 දින වත්තල ප්‍රාදේශිය ලේකම් විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත ප්‍රකාරව දික්ඕවිට ධිවර වරායේ පිහිටි අංක SSP 430 පිඹුරේ ලොට් X වශයෙන් දක්වා ඇති පර්චස් 110 ක (රූඩ්:02 පර්:30) භූමි ප්‍රමාණය පැවරීමේ සහතිකයක් මඟින් ධිවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට පවරා දී තිබුණි. එසේ වුවද ලංකා ධිවර වරාය නීතිගත සංස්ථාව විසින් නීත්‍යානුකූලව හිමිකමින් නොමැති ඉහත දක්වා ඇති ඉඩම් කොටස 2021 ඔක්තෝබර් 04 දින සිට වසර 20 ක කාලයකට මාසික බදු පදනම මත පෞද්ගලික සමාගමක් වෙත බද්දට දී තිබුණු අතර මෙය අමාත්‍යාංශයේ අධීක්ෂණයෙන් බැහැරව සිදු වී තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය විසින් මෙම ඉඩම නීත්‍යානුකූලව ධිවර වරාය නීතිගත සංස්ථාව වෙත පවරා දීමට කටයුතු කර නොතිබුණු අතර මේ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට රු.2,335,438 ක හිඟ බදු මුදල් සහ සියයට 2 ක ප්‍රමාද ගාස්තු අය කර ගැනීම සඳහා බදු ගිවිසුමේ සඳහන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද, රජයේ ගිණුමට අදාළ වවුවර් සහතික කරන චෙක්පත් අත්සන් කරන අය ද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් ධිවර අමාත්‍යාංශයේ අදාළ නිලධාරීන් ඇප තැන්පත් කර නොතිබුණි.

4.5 පාඩු හා හානි

(අ) ධිවර අමාත්‍යාංශය පිහිටා ඇති ගොඩනැගිල්ලෙහි අතිරේක මහල් තුනක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේ දී කොන්ත්‍රාත් සමාගමේ නොසැලකිල්ල හේතුවෙන් ගොඩනැගිල්ලේ බිම් සහ ස්ලැබ් හරහා වැසි ජලය කාන්දුවීම නිසා හය වැනි මහල හා පස් වැනි මහලෙහි භාණ්ඩ හා දේපලවලට හානි සිදු වී ඇති බවත් අදාල කොන්ත්‍රාත් සමාගමෙන් 2024 ජුනි 12 දිනැති මුදල් රෙගුලාසි 104 යටතේ කරන ලද පරීක්ෂණ වාර්තාව මඟින් අනාවරණය වී තිබුණි.

(ආ) මෙම හානිය,ස්වාභාවික හේතුවක් මත සිදු වූ හානියක් නොවන බැවින්ද, එහි කොන්ත්‍රාත් සමාගම විසින් මෙය වලක්වා ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් යොදවා නොතිබූ බැවින්ද මුදල් රෙගුලාසි 103 යටතට වැටෙන හානියක් බව උක්ත වාර්තාව මඟින් තීරණය කර තිබුණි.ඒ අනුව ධිවර අමාත්‍යාංශයට සිදු වූ රු.610,996 කට අධික හානි පූරණයට අදාළ මුළු වියදම කොන්ත්‍රාත් සමාගමෙන් අයකර ගැනීමට කටයුතු කිරීම සුදුසු බවත් එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණු නමුත් මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ හෙළිදරව් කර නොතිබුණි.

4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (ඉ) උපවගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගකිව යුතු වුවද 2024 වර්ෂය සඳහා නිකුත් කර තිබුණු විගණන විමසුම් 4 කට 2025 අප්‍රේල් 25 දිනවන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

4.7 කළමනාකරණ දුර්වලතා

(අ) අමාත්‍යාංශයේ දැනට පවතින අභ්‍යන්තර දුරකතන පද්ධතිය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් ධිවර අමාත්‍යාංශයේ සවිකර ඇති අතර 2024 දෙසැම්බර් 20 දිනවන විට පද්ධතියේ දුරකතන මාර්ග 232 ක් පැවතුණි. ඉන් 130 ක් භාවිතයේ පවතින අතර 20 අක්‍රිය තත්ත්වයේ ද 82 ක් ක්‍රියාකාරී තත්ත්වයේ ඇති නමුත් භාවිතා නොකර තිබුණි. මෙම දුරකථන පද්ධතිය වෙනුවට දුරකතන මාර්ග 150 කින් සමන්විත නව පද්ධතියක් අමාත්‍යාංශ පරිශ්‍රය සඳහා රු.2,687,319 ක් වැනි මුදලකට සවි කිරීමට සැලසුම් කර තිබුණි. දැනට පවතින අභ්‍යන්තර දුරකතන පද්ධතියේ දුරකතන මාර්ග 232 ක ධාරිතාවයක් පැවතිය දී සහ එහි දෝෂ පිළිබඳ වාර්තා නොතිබියදී ඊට අඩු දුරකතන මාර්ග 150 ක ධාරිතාවයකින් යුත් නව පද්ධතියක් සවිකිරීමට හේතු විගණනයට පැහැදිලි නොවිය.

(ආ) ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ VMS ගොඩනැගිල්ලේ කාර්යාල සඳහා අභ්‍යන්තර දුරකතන සබඳතා ලබාගැනීම සඳහා එම දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා අවස්ථා කිහිපයක දී අමාත්‍යාංශය වෙත ඉල්ලීම් සිදුකර තිබුණද 2024 දෙසැම්බර් 31 දිනවන විටත් අමාත්‍යාංශය විසින් එම ගොඩනැගිල්ල සඳහා දුරකතන සබඳතා සැපයීම සිදුකර නොතිබුණි. දැනට පවතින අභ්‍යන්තර දුරකතන පද්ධතියේ භාවිතා කර නොමැති ක්‍රියාකාරී තත්ත්වයේ පවතින දුරකතන මාර්ග භාවිතා කර එම අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කළ හැකිව තිබුණ ද 2024 දෙසැම්බර් 31 දිනවන විටත් එම අවශ්‍යතාවය සපුරාලීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2023/2024 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද කලපු තුළ ඉස්සන් පසු කිටයන් තැන්පත් කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම් විසින් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවූ 2023 නොවැම්බර් 06 දිනැති අංක MF/SD/03/NARA/02-2023 දරන ලිපිය අනුව වාණිජ ඉස්සන් කර්මාන්තය සඳහා රෝග පැතිරවීම වැළැක්වීම සඳහා ඉස්සන් පසු කිටයන් නිෂ්පාදනය කරන මෙම අභිජනනාගාර ක්‍රියාවලිය දැඩි ලෙස අධීක්ෂණය කළ යුතු බවත්, ඒ අනුව NARA ආයතනයේ නිලධාරියෙකු අභිජනනාගාරවල කටයුතු අධීක්ෂණය සඳහා පූර්ණකාලීනව යොදවා භෞතිකව අධීක්ෂණය කිරීම අත්‍යාවශ්‍ය බවත් දක්වා තිබුණි. නමුත් NARA ආයතනය මඟින් අභිජනනාගාර අධීක්ෂණය සඳහා පූර්ණකාලීනව නිලධාරියකු යොදවා තිබූ බවට කිසිදු සාක්ෂියක් විගණනයේ දී නිරීක්ෂණය නොවූ අතර NARA ආයතනය වෙත යවන ලද උක්ත ලිපියට අදාල ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන්න පිලිබඳව අමාත්‍යාංශය විසින් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

5 මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්තකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2024 දෙසැම්බර් 31 දිනට සිවර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු 30 කට අදාළව පුරප්පාඩු 09 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 04 කට අදාළව එක් පුරප්පාඩුවක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 164 කට අදාළව පුරප්පාඩු 69 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 40 කට අදාළව පුරප්පාඩු 03 ක්ද හා එම පුරප්පාඩු පිරවීමට වෙනත් මට්ටමේ තනතුරු 03 කට අදාළව පුරප්පාඩු 02 ක් පැවතුණි. එම පුරප්පාඩු පිරවීමට 2025 අප්‍රේල් 29 දින වන විටත් අමාත්‍යාංශය අපොහොසත්ව තිබුණි.

(ආ) ජනාධිපති ලේකම්ගේ 2010 මැයි 14 දිනැති අංක සිජ්/1/17/1 ලිපියේ 2.1 ඡේදය ප්‍රකාරව ගරු අමාත්‍යවරයෙකුගේ කාර්යාලවල සේවයේ නියුක්ත කරවනු ලබන සහායක කාර්යය මණ්ඩලය 15 ක් නොඉක්මවිය යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දිනට තථ්‍ය අමාත්‍ය කාර්යය මණ්ඩලය 19 දෙනෙකු විය.ඒ අනුව කාර්යය මණ්ඩලයේ 04 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි. තව ද සහකාර ලේකම් (වෘත්තිය සමිති හා සේවක සබඳතා) යන තනතුර මෙම චක්‍රලේඛයේ 2.1 ඡේදයට පටහැනි තනතුරක් ලෙස පැවතුණි.

එස්.එන්.වැලිකල
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැඩබලන) වෙනුවට